# පාල සහ සේන සමයයේ බුද්ධ ප්‍රතිමාවෙහි රූප භේද

මැදගේ පාලින්ද රසාන්ජිත් මැදගේ[1]

බුද්ධ ප්‍රතිමාව ලොවට මුලින් ම බිහි වූ බව පිළිගන්නේ කණිෂ්ක රාජ්‍ය සමයේදීය. පසුව බුද්ධ ප්‍රතිමා නිර්මාණය ගාන්ධාර, මථුරා, ගුප්ත හා අමරාවතී යුගයන්හි සුවිශේෂ ලක්ෂණ සහිතව නිර්මාණය විය. අවසන් වරට ඉන්දීය භූමියෙහි බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වන්නේ පාල හා සේන යුගයවල දී ය. මෙකී යුගවලට වඩා පාල හා සේන යුගවලට අයත් ඉන්දීය බුද්ධ ප්‍රතිමාව කැපීපෙනෙන්නේ බෞද්ධාගමික ලක්ෂණ මෙන් ම ඒවායෙහි හින්දු ආගමික ලක්ෂණ ද සම්මිශ්‍රණය වූ බුද්ධ ප්‍රතිමා නිර්මාණය කෙරෙහි ශිල්පීන්ගේ අවධානය යොමු වීම යි. මේ නිසා ශාක්‍යමුනි ගෞතම බුදුන් නියෝජනය වන බුද්ධ ප්‍රතිමා වෙනුවට ධ්‍යානී බුදුවරුන් නිරූපණය වන ප්‍රතිමා කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. මේ පත්‍රිකාවේ අරමුණ වන්නේ ඒකී මහායාන සහ තාන්ත්‍රික ලක්ෂණ පිළිබිඹු කරන බුද්ධ ප්‍රතිමාවල රූපභේද අධ්‍යයනය කිරිම යි. මේ ප්‍රතිමා නිර්මාණය කිරීම උදෙසා කළුගල් මෙන් ම මැටි තඹ ලෝකඩ ලී පිත්තල රන් අලේපිත තඹ ආදි අමුද්‍රව්‍ය ද උපයෝගී කරගන්නා ලද ප්‍රතිමා පහකි. ඒවා නම්, අක්ෂෝභය, වෛරෝචන, අමිතාභ, රත්නසම්භව හා අමෝඝසිද්ධි ආදිය යි. සම්ප්‍රදායික චීවරය වෙනුවට දෙවුර වසා ඇති වස්ත්‍රය පාදාන්තය දක්වා ද ශිර්ෂ පලඳනා ප්‍රභා මණ්ඩලය මුද්‍රා භාවිතය මෙන් ම උදරය ශරීරයේ අනෙකුත් අවයවවලට සාපේක්ෂ ව කෙටි සහ පසුකාලීන ව දිගටි අතපය සහ ශාරීරක ලක්ෂණ බුද්ධ ප්‍රතිමාවෙහි රූපභේදවලට එකතු විය. හිටි බුද්ධ ප්‍රතිමාවන්ට සාම්ප්‍රදායික ව භාවිත වූ අභය හා වරද මුද්‍රාවලට අමතර ව විතර්ක මුද්‍රාව ද, හිඳි පිළිම සඳහා භූමිස්පර්ශ, ධර්මචක්‍ර, වරද හා ධ්‍යානී මුද්‍රා ප්‍රභේදයකින් තොර ව භාවිත වූ බව පෙනේ. ගෞතම බුදුන් වහන්සේගේ විවිධ අවස්ථා මුද්‍රා මඟින් නිරූපණය මුල් යුගවල දී සිදු වුවත් මේ යුගයේ දී මහායාන බුදුන්වරුන් හඳුනාගැනීමට මේ මුද්‍රා භාවිත විය. ඒ අනුව ධර්මචක්‍ර මුද්‍රාව මඟින් වෛරෝචන ද, භූමිස්පර්ශ මුද්‍රාව මඟින් අක්ෂෝභය ද, වරද මුද්‍රාව මඟින් රත්නසම්භව ද, ධ්‍යානී මුද්‍රාව මඟින් අමිතාභ ද, අභය මුද්‍රාව මඟින් අමෝඝසිද්ධි ද, නියෝජනය විය. මීට අමතර ව ධ්‍යානී බුදුවරුන් සමඟ භාර්යාවන් දැක්වීම ද මේ යුගයේ ජනප්‍රිය වු බව පෙනේ. මේ අනුව සැලකීමේ දී කුෂාණ ගුප්ත යුගවලට වඩා පාල සහ සේන යුගවලට අයත් බුද්ධ ප්‍රතිමාවන්හි රූපභේද වෙනස් ආකාරයට ඉදිරිපත් වූ බව පැහැදිලි ය.

**ප්‍රමුඛ පද**: බුද්ධ ප්‍රතිමාව, මහායාන සහ තාන්ත්‍රික ලක්ෂණ, රූපභේද, මුද්‍රා, ආගමික ලක්ෂණ

[1] ලලිත කලා අධ්‍යයනාංශය